# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1932/50 - 2015 සැප්තැම්බර් මස 16 වැනි බදාදා - 2015.09.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වන ව්‍යවස්ථාවේ 13(ආ) අනුව්‍යවස්ථාව යටතේ පුරප්පාඩුවක් පිරවීම

අංක 19 - බදුල්ල මැතිවරණ කොට්ඨාසය සඳහා 1988 අංක 15 දරන පනතින් සංශෝධිත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 62 වන වගන්තිය යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද බව ප්‍රකාශයට පත් කරන ලද දොන් ආතර් චාමර සම්පත් දසනායක මහතා ඉල්ලා අස්වීම හේතුකොට ගෙන අට වන පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධූරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව, ඉහත කී පනතේ 64(1) වන වගන්තිය යටතේ පාර්ලිමේන්තුවේ මහලේකම් විසින් මා වෙත දැනුම් දී ඇති හෙයින් ද ;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වන ව්‍යවස්ථාවේ 13(ආ) අනුව්‍යවස්ථාව යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි මෙම පුරප්පාඩුව පුරවන ලෙස එකී මන්ත්‍රීවරයා තෝරා පත්කර ගන්නා ලද මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරියාට ඉහත කී පනතේ 64(1) වන වගන්තිය යටතේ මා විසින් විධාන කරනු ලැබූ හෙයින් ද ;

තේරීම්භාර නිලධරයා විසින් එකී පනතේ 64(2) වන වගන්තිය යටතේ ක්‍රියාකරමින් එකී මැතිවරණ කොට්ඨාසය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස ලක්ෂ්මන් පින්තු ජයතිලක සෙනෙවිරත්න මහතා තෝරා පත් කරන ලද බව ප්‍රකාශයට පත්කර, එම පනතේ පළමුවන උපලේඛනයේ ''ක'' ආකෘතිය මත වාර්තාව ඉදිරිපත් කොට ඇති හෙයින් ද ;

මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය වන මම, එකී පනතේ 64(2) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් ඉහත කී දොන් ආතර් චාමර සම්පත් දසනායක මහතා ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව පිරවීම පිණිස අංක 19 - බදුල්ල මැතිවරණ කොට්ඨාසය සඳහා අටවන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු ලෙස ලක්ෂ්මන් පින්තු ජයතිලක සෙනෙවිරත්න මහතා තෝරා පත් කළ බව ප්‍රකාශයට පත් කරන ලද බව මහජනයා වෙත මෙයින් දන්වා සිටිමි.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2015 සැප්තැම්බර් මස 16 වැනි දින,
රාජගිරිය,
සරණ මාවත,
මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ දී ය.

10 - 162


1A - G 22336 — 381 (2015/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*